| 10 ශ්‍රේණිය | තෙවන ඒකකය<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය<br>Information & Communication Technology | I කොටස |
|---|---|---|

1. පහත දැක්වෙන කුමක් ටෙරාබයිට් (TB) එකකට ආසන්න ලෙස තුල්‍ය වේ ද? (2016)
   1) $1 \times 10^6$ MB
   2) $1 \times 10^6$ GB
   3) $1 \times 10^6$ KB
   4) $1 \times 10^9$ bytes

2. අෂ්ටමය 64 ට තුල්‍ය වන දශමය සංඛ්‍යාව කුමක් ද? (2016)
   1) 48 2) 52 3) 62 4) 68

3. ද්විතීයික ආචයන උපක්‍රමවල දත්ත හුවමාරු වේගය වැඩි වන පිළිවෙළ දැක්වෙන වරණය කුමක් ද? (2016)
   1) ඝන තත්ත්වයේ (Solid state) දෘඪතැටි ධාවකය, චුම්භක දෘඪතැටි ධාවකය, නම්‍ය තැටි ධාවකය, DVD ධාවකය
   2) නම්‍ය තැටි ධාවකය, චුම්භක දෘඪතැටි ධාවකය, DVD ධාවකය, ඝන තත්ත්වයේ දෘඪතැටි ධාවකය
   3) නම්‍ය තැටි ධාවකය, DVD ධාවකය, චුම්භක දෘඪතැටි ධාවකය, ඝන තත්ත්වයේ දෘඪතැටි ධාවකය
   4) ඝන තත්ත්වයේ දෘඪතැටි ධාවකය, චුම්භක දෘඪතැටි ධාවකය, DVD ධාවකය, නම්‍ය තැටි ධාවකය

4. ඇස්කි (ASCII) කේතයෙහි 'Q' අක්ෂරය $1010001_2$ මගින් නිරූපණය වේ. 'PUT' යන වචනය ද්විමය ආකාරයෙන් නිරූපණය වන වරණය කුමක් ද? (2016)
   1) $1010000_2$ $1010101_2$ $1010100_2$
   2) $1010001_2$ $1010101_2$ $1010100_2$
   3) $1010000_2$ $1010011_2$ $1010111_2$
   4) $1010101_2$ $1010100_2$ $1010011_2$

5. එකිනෙකට වෙනස් සංඛ්‍යා පද්ධති මගින් ඉදිරිපත් කර ඇති පහත දැක්වෙන සංඛ්‍යා හතර සලකන්න. (2016)

   $11110011_2$, $F3_{16}$, $363_8$, $243_{10}$

   ඉහත සංඛ්‍යා හතරට අදාළ ව පහත කුමන වගන්තියක් සත්‍ය වේ ද?
   1) $F3_{16}$ අනෙක් සංඛ්‍යා තුනට වඩා විශාල වේ.
   2) $363_8$ අනෙක් සංඛ්‍යා තුනට වඩා කුඩා වේ.
   3) සංඛ්‍යා හතර ම එකිනෙකට සමාන වේ.
   4) සංඛ්‍යා හතර එකිනෙකට සමාන නො වේ.

6. $01011_2$ යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය දශමය සංඛ්‍යාව කුමක් ද? (2017)
   1) 11 2) 35 3) 15 4) 10

7. $111110110010_2$ යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය අෂ්ඨක සංඛ්‍යාව කුමක් ද? (2017)
   1) $7552_8$ 2) $2667_8$ 3) $2557_8$ 4) $7662_8$

8. $11101011000111010_2$ ට තුල්‍ය ෂඩ්දශමය සංඛ්‍යාව වන්නේ, (2017)
   1) $DD63A_{16}$ 2) $1D63A_{16}$ 3) $1D33A_{16}$ 4) $1D631_{16}$

9. පහත සඳහන් ප්‍රකාශ සලකන්න. (2017)

   A – $2B_{16}$ යන්න $53_8$ ට තුල්‍ය වේ. B - $43_{10}$ යන්න $101011_2$ ට තුල්‍ය වේ.
   C – $101011_2$ යන්න $53_8$ ට තුල්‍ය වේ.

   ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,
   1) A හා B පමණි.
   2) A හා C පමණි.
   3) B හා C පමණි.
   4) A, B, C සියල්ල ම ය.

10. පහත සඳහන් වගන්ති සලකා බලන්න. (2017)

    A – පරිගණකයක රෙජිස්තර මතක (register memory) ධාරිතාව දෘඪ තැටියක ධාරිතාවට වඩා කුඩා වේ.
    B - රෙජිස්තර මතකයේ දත්ත ප්‍රවේශ වේගය (access speed) දෘඪ තැටියේ එම වේගයට වඩා අඩු වේ.
    C - රෙජිස්තර මතකයේ දත්ත ආචයනය (store) සඳහා බිටුවකට යන වියදම, දෘඪ තැටියේ දත්ත ආචයනය සඳහා බිටුවකට යන වියදමට වඩා වැඩි වේ.

    ඉහත වගන්ති අතුරෙන් සත්‍ය වන්නේ,
    1) A හා B පමණි
    2) A හා C පමණි
    3) B හා C පමණි
    4) A, B හා C සියල්ලම ය.

11. පරිගණකයක් තුළ දත්ත හා උපදෙස් ආචය (Store) වී ඇත්තේ කවර ආකාරයකින් ද? (2018)
    1) ද්විමය
    2) දශමය
    3) ෂඩ්දශමය
    4) අෂ්ඨක

12. $156_{10}$ දශමය සංඛ්‍යාවට තුල්‍ය වන අෂ්ඨක සංඛ්‍යාව කුමක් ද? (2018)
    1) $121_8$ 2) $234_8$ 3) $574_8$ 4) $770_8$

ICT Tutorials HUB

13. $2B_{16}$ ෂඩ්දශමය සංඛ්‍යාවට තුල්‍ය වන ද්වීමය සංඛ්‍යාව කුමක් ද? (2018)
1) $00101011_2$
2) $01001001_2$
3) $10010100_2$
4) $10110011_2$

14. පහත සදහන් කවරක් මගින් $10011001_2$, $113_8$, $160_{10}$ සහ $1A_{16}$ යන සංඛ්‍යා හතරේ ආරෝහණ පටිපාටිය නිරූපණය කරන්නේ ද? (2018)
1) $10011001_2$, $113_8$, $160_{10}$, $1A_{16}$
2) $160_{10}$, $1A_{16}$, $10011001_2$, $113_8$
3) $160_{10}$, $1A_{16}$, $113_8$, $10011001_2$
4) $1A_{16}$, $113_8$, $10011001_2$, $160_{10}$

15. '800' ලෙස දිස්වෙන සංඛ්‍යාව වලංගු සංඛ්‍යාවක් වන්නේ පහත දක්වා ඇති සංඛ්‍යා පද්ධති අතුරින් කවරක ද?(2018)
1) දශමය පමණි.
2) දශමය හා ෂඩ්දශමය පමණි.
3) දශමය හා අෂ්ඨක පමණි.
4) අෂ්ඨක පමණි.

16. පහත සදහන් වගන්ති අතුරෙන් කවරක් සත්‍ය වන්නේ ද? (2019)
A - පරිගණක තුළ දත්ත හා උපදෙස් ආචයනය වී ඇත්තේ ද්වීමය ආකාරයෙනි.
B – 945 සංඛ්‍යාව අෂ්ටක හා ෂඩ්දශමය සංඛ්‍යා පද්ධති දෙකටම වලංගු වේ.
C – $412_8$ තුල්‍ය වන්නේ $100001010_2$ ට ය.
1) A පමණි
2) B පමණි
3) A හා C පමණි
4) A, B හා C සියල්ලම

17. ප්‍රවේශ වේගය අනුව දී ඇති ආචයන සංරචක අවරෝහණ පිළිවෙළට සකසා ඇති වරණය කුමක් ද? (2019)
1) නිහිත මතකය (Cache), ප්‍රධාන මතකය, රෙජිස්තර, දෘඪ තැටිය
2) දෘඪ තැටිය, නිහිත මතකය, රෙජිස්තර, ප්‍රධාන මතකය
3) රෙජිස්තර, නිහිත මතකය, ප්‍රධාන මතකය, දෘඪ තැටිය
4) රෙජිස්තර, ප්‍රධාන මතකය, දෘඪ තැටිය, නිහිත මතකය

18. 'E' අක්ෂරය ASCII වගුවේ $69_{10}$ ලෙස නිරූපණය වේ නම්, ASCII වගුවට අනුව 'G' අක්ෂරයේ ද්වීමය නිරූපණය කුමක් ද? (2019)
1) 1000110
2) 1000111
3) 1001000
4) 1001001

19. පරිගණක පද්ධතිවල දත්ත මිනුම් ඒකක, ඒවායේ විශාලත්වයට අනුව ආරෝහණ පටිපාටියට දක්වන්නේ පහත කවරක් මගින් ද? (2020)
1) බිටුව, බයිටය, කිලෝබයිටය, ටෙරාබයිටය
2) බයිටය, බිටුව, කිලෝබයිටය, ටෙරාබයිටය
3) මෙගාබයිටය, කිලෝබයිටය, බිටුව, බයිටය
4) ටෙරාබයිටය, ගිගාබයිටය, මෙගාබයිටය, කිලෝබයිටය

20. මේස පරිගණකයක් තුළ පවතින ආචයන උපක්‍රම (Storage Devices), ඒවායේ ආචයන ධාරිතාව අනුව අවරෝහණ පටිපාටියට දක්වන්නේ කුමකින් ද? (2020)
1) රෙජිස්තර (Registers), නිහිත මතකය (Cache Memory), දෘඪ ඩිස්කය
2) දෘඪ ඩිස්කය, සසම්භාවී මතක ප්‍රවේශය (RAM), රෙජිස්තර
3) සසම්භාවී ප්‍රවේශ මතකය, රෙජිස්තර, නිහිත මතකය
4) සසම්භාවී ප්‍රවේශ මතකය, නිහිත මතකය, දෘඪ ඩිස්කය

21. පහත කුමන වරණයෙහි දී ඇති සංඛ්‍යා හතරෙහි ආරෝහණ පටිපාටියට දැක්වේ ද? (2020)
1) $64_{16}$ , $226_8$ , $200_{10}$ , $101011_2$
2) $101011_2$ , $64_{16}$ , $226_8$ , $200_{10}$
3) $101011_2$ , $64_{16}$ , $200_{10}$ , $226_8$
4) $200_{10}$ , $226_8$ , $101011_2$ , $64_{16}$

22. පරිගණක පද්ධතියක දී ඇති ආචයන (storage) සංරචක ඒවායේ ආචයන ධාරිතාවට අනුව අවරෝහණ පිළිවෙළට පහත සදහන් කුමන පිළිතුර මගින් නිවැරදිව පෙන්වනු ලබන්නේ ද? (2021)
1) දෘඪ ඩිස්කය, නිහිත මතකය (Cache memory), ප්‍රධාන මතකය
2) දෘඪ ඩිස්කය, ප්‍රධාන මතකය, නිහිත මතකය
3) ප්‍රධාන මතකය, නිහිත මතකය, දෘඪ ඩිස්කය
4) ප්‍රධාන මතකය, දෘඪ ඩිස්කය, නිහිත මතකය

23. ASCII කේත ක්‍රමයේදී "A" අනුලක්ෂණය (Character) $1000001_2$ ලෙස නිරූපණය වේ නම්, $1000100_2$ කුමන අනුලක්ෂණයක් නිරූපණය කරනු ලබන්නේ ද? (2021)
1) B
2) C
3) D
4) E

24. පහත දී ඇති සංඛ්‍යා හතර අවරෝහණ පිළිවෙළට නිරූපණය කර ඇත්තේ කවරකින් ද? (2021)
1) $10011110_2$, $157_{10}$, $9C_{16}$, $233_8$
2) $157_{10}$, $10011110_2$, $9C_{16}$, $233_8$
3) $233_8$, $10011110_2$, $157_{10}$, $9C_{16}$
4) $9C_{16}$, $233_8$, $10011110_2$, $157_{10}$

ICT Tutorials HUB

25. පහත ඒවායින් විශාලතම සංඛ්‍යාව කුමක් ද? (2022)

1) $1000\ 0100_2$
2) $15_8$
3) $85_{10}$
4) $C2_{16}$

26. ද්විමය $1000\ 0101_2$ ට තුල්‍ය දශමය සංඛ්‍යාව කුමක් ද? (2022)

1) $85_{10}$
2) $133_{10}$
3) $161_{10}$
4) $266_{10}$

27. අෂ්ටක $1156_8$ ට තුල්‍ය ෂඩ් දශමය සංඛ්‍යාව කුමක් ද? (2022)

1) $26E_{16}$
2) $484_{16}$
3) $109C_{16}$
4) $2204_{16}$

28. දී ඇති විශාලත්ව සහිත ගොනු හතර USB ධාවකයකට පිටපත් කිරීමට අමරට අවශ්‍ය විය. (2022)

invitation.doc (15KB), yesterday.mp3 (26MB), concert (150MB), tajmal.jpg (28KB)

ධාරිතාවන් දක්වා ඇති පහත හිස් USB ධාවක හතර අතුරෙන්, ඉහත ගොනු ආචය (store) සඳහා භාවිත කළ හැකි වඩාත් පිරිමැසුම්දායක ධාවකය කුමක් ද? (USB ධාවකයේ ගොනු කළමණාකරණය සඳහා අවශ්‍ය අවකාශය නොසලකන්න.)

1) 1GB
2) 2GB
3) 128MB
4) 256MB

29. ASCII වගුවෙන් ගෙන ඇති පහත දැක්වෙන අනුලක්ෂණ-අගය අනුරූපණය සලකන්න. (2022)

O – 79    / - 47    L – 76    o – 111    l – 108

O/L හි ASCII නිරූපණය ද්විමය ලෙස පහත කවරක දැක්වේ ද?

1) 1001111 1001100
2) 1101111 1101100
3) 1001111 0101111 1001100
4) 1101111 0101111 1101100

ICT Tutorials HUB